රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2012(II)

මගේ අංකය : CS /ICTS/01/Abs. Exam
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2017.09.11

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රදේශීය ලේකම්වරුන් වෙත

**<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය- 2017</u>**

අංක 1894/26 හා 2014 දෙසැම්බර් 26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2014 දෙසැම්බර් 23 දිනැති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා 2011.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2011 මගින් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට අනුව එකී සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කර ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා වූ යෝග්‍යතා පරීක්ෂණයක් පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

02. ඒ අනුව 2012.05.20 දින සහ 2013.08.24 දින පැවති යෝග්‍යතා පරීක්ෂණයන්ට කවර හෝ හේතුවක් නිසා පෙනී සිටීමට නොහැකිවූ, අසමත්වූ අපේක්ෂකයන් සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011 (iii) අනුව අන්තර්ග්‍රහණය වීම සඳහා අයදුම් කල නිලධාරීන් සඳහා පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) 2017 ඔක්තෝම්බර් මස 14 දින කොළඹ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය කල් දැමීමට හෝ අවලංගු කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. සුදුසුකම් : නිශ්චිත වශයෙන්ම පරිගණක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළ තනතුරු සඳහා විධිමත්ව බඳවාගෙන ඇති නිලධරයන් අතුරින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව MN- 1 -2006-A, MN- 2 -2006 A හා MT- 1 -2006 A වැටුප් පරිමාණයන් හිමිව ඇති තනතුරු දරණ පහත සඳහන් නිලධරයන් මෙම යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

i. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2011 හි 5.1 (ii) (අ), (ආ) ප්‍රකාර වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ නොවීමේ හේතුව මත මෙතෙක් අන්තර්ග්‍රහණය වී නොමැති නිලධරයන්

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011 (iii) අනුව 2009.07.01 දින සිට 2011.02.15 දින දක්වා රාජ්‍ය සේවයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල ස්ථිර තනතුරු දරන, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වීම සඳහා අයදුම් කල නිලධරයන්

04. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කර ගැනීමේ සහන කාලය 2017 ඔක්තෝම්බර් මස 14 දින දක්වා දීර්ඝ කරනු ලැබේ. තවද මෙම විභාගය නිලධරයන්ගේ වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කිරීම වෙනුවෙන් පමණක් පවත්වනු ලැබේ.

05. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම විභාගය පවත්වනු ලබන අතර ඒ හා සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවේ.

06. ඉල්ලුම් පත්‍රය මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු අතර නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2017 සැප්තැම්බර් මස 21** දින හෝ ඊට පෙර ලැබෙන සේ ***"ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය , කොළඹ 07."*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමේ යෝග්‍යතා පරීක්ෂණය" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන අයදුම්පත්‍ර පිළිබඳව ද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත්‍ර පිළිබඳව පැමිණිලි සලකා බලනු නොලැබේ.

07. අයදුම්පත්‍ර - අංක 1.0 සිට 3.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය ඊළඟ පිටුවට ද ඇතුලත් වන පරිදි "A4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය පරිගණකය මගින් පිළියෙල කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතු අතර අයදුම්පත්‍රයේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිමි.

7.1 ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් විසින් තමන් සේවයට බැඳුනු භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි

භාෂාවෙන් විභාගයට පෙනී සිටිය හැකිය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.3 ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම චක්‍රලේඛයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.4 නිලධරයා විසින් සම්පූර්ණ කළ අයදුම්පත් ලැබුණු දිනයේ තම කාර්යාලීය දින මුද්‍රාව තැබීමත් ඒවායේ අදාල කොටසේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය සම්පූර්ණ කර සහතික කර, සහතික කළ දිනය ද සහිතව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පෙර ලැබෙන සේ එවීමත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ අමාත්‍යාංශ ලේකම්ගේ වගකීම වනු ඇත.

08. ලිඛිත පරික්ෂණය සඳහා වන අයදුම්පත් පිළිගත් සියළුම අපේක්ෂකයන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග මධ්‍යස්ථානයේ දී එහි ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාග අපේක්ෂකයන් තමන්ට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

09. විභාග දිනට සතියකට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබුණු අයදුම්කරුවන් වේ නම්, ඔවුන් වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියක් පිටපතක් ළඟ තබාගෙන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ප්‍රවේශපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. තවද ඉහත ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව කරනු ලබන විමසීම් සලකා බලනු නොලැබේ.

10. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධරයන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයන් විභාගයට පෙනී සිටීමේදී විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සදහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

12. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඩුවම් :-

i. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත් එසේත් නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

13. විභාග පරිපාටිය : විභාග ප්‍රශ්න පත්‍රය සහ එහි විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| **විෂය** | **ලකුණු** | **කාලය** |
|---|---|---|
| මූලික පරිගණක තාක්ෂණ දැනුම | ලකුණු 100 | පැය 1 1/2 |

මෙම ප්‍රශ්නපත්‍රය බහුවරණ හා ඉලක්කගත ප්‍රශ්නවලින් සමන්විත වන අතර පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පහත සඳහන් විෂය සංරචකයන් යටතේ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සාමාන්‍ය දැනුම
(General knowledge on Information and Communication Technology)

ii. මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග, දෘඩාංග පිළිබඳ දැනුම
(Knowledge on Operating systems, Software and Hardware)

iii. දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය
(Data Base Design and application)

iv. අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල භාවිතා කිරීමේ හැකියාව
(Ability to use the Internet and the Electronic Mail ).

**සටහන :- මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් ලකුණු හතලිහක් (40) ලබා ගත යුතු වේ.**

14. මෙම චක්‍රලේඛය මඟින් විධිවිධාන සලස්වා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

**ජේ. ජේ. රත්නසිරි**
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කර ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය - 2017</u>

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:

සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

---

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :- ......................................................

..............................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ:- SILVA, A.B.

1.2 සම්පූර්ණ නම :- ......................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :- ......................................................................................................

(සිංහලෙන්/ දෙමළෙන්)

2.0 2.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය :- .............................................

..............................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය :- .............................................

..............................................................................................................................

(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :- ......................................................................

..............................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :-

ස්ත්‍රී - 1

පුරුෂ - 0

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන්දිනය :- වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

4.0 4.1 මෙම චක්‍රලේඛයේ සඳහන් පරිදි ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියට අදාල තනතුරකට මුලින්ම පත් වූ දිනය :- ..............................................................

4.2 එම දිනට දරණ ලද තනතුර :- ...............................................................................

05. 5.1 වර්තමාන තනතුර :- ...................................................................................................

5.2 වර්තමාන සේවා ස්ථානය සහ ලිපිනය :- ..........................................................................

..........................................................................................................................................

<u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..............................................................

අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන

දිනය :- ........................................

<u>අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ තොරතුරු .................................................................. මයා/මිය/මෙය ගේ සේවා වාර්තා සමඟ සංසන්දනය කළ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියට අදාල තනතුරක සේවය කරන බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසුකම් ලබන බවත්, මෙයින් සහතික කරමි.

..................................................................

දිනය :- ................................. අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

සහතික කරන අයගේ සම්පූර්ණ නම :- ...........................................................................................

පදවි නාමය :- ..................................................................

(පදවි නාමය රබර් මුද්‍රාවක් තැබීමෙන් තහවුරු කළ යුතුය)